# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் / Website: www.treasury.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. බීඩී/එම්එම්/එන්අයි 177/09/02/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதි / Date 2011.07. 21 |

අයවැය චක්‍රලේඛ 153

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත

**දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය**
**ඔයාමඩුව අනුරාධපුරය - 2012**

දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය 2012 ට අදාලව, දැයට කිරුළ සම්බන්ධීකරණ ලේකම් විසින් 2011 ජූනි 29 වන දින අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත නිකුත් කළ ලිපියෙහි සඳහන් උපදෙස් කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන - 2012 අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට සහ දැයට කිරුළ ප්‍රදර්ශනය ඔයාමඩුව ප්‍රදේශයේ පැවැත්වීමට රජය තීරණය කර ඇත. රටේ සමස්ථ වශයෙන් සිදුවන සංවර්ධන කටයුතු දැයට කිරුළ ප්‍රදර්ශනය මගින් පිළිබිඹු කිරීමත්, දැයට කිරුළ පැවැත්වෙන දිස්ත්‍රික්කය පූර්ණ සංවර්ධනයකට ලක් කිරීමත් මෙම වැඩසටහනේ මූලික අරමුණ වනු ඇත.

03. ප්‍රදර්ශන කටයුතු කරනු ලබන භූමියේ ප්‍රදර්ශන කටයුතු වලින් පසු ස්ථාවරව පවත්වාගත හැකි මූලික යටිතල පහසුකම්, නිවාස, නවාතැන්පලවල්, ප්‍රජාශාලා වැනි පොදු පහසුකම් සකස්කර ගත හැකි පරිදි සංවිධානය කිරීමට අපේක්ෂා කරන අතර එයට අදාල සැලසුම් හා උපදෙස් වෙනම නිකුත් කරනු ලැබේ. එම පහසුකම් ප්‍රදර්ශන කුටි කර ගැනීමෙන් අනවශ්‍ය වියදම්ද අඩුකර ගත හැකි අතර, එම පහසුකම් ඉදිකිරීම මනාව සැලසුම් කළ යුතුය. ඒ පිළිබඳ උපදෙස් ද ඉක්මණින් නිකුත් කරනු ඇත.

04. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන සඳහා ව්‍යාපෘති තෝරා ගැනීමේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි ජනතාවගේ ජීවන තත්වය ඉහළ නංවාලීම මූලික අරමුණ කරගත් ප්‍රදේශයේ යටිතල පහසුකම්, අධ්‍යාපන, සෞඛ්‍ය සේවාවන් වැනි පොදු පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුය.

05. ඔබ අමාත්‍යාංශය විසින් මේ සඳහා ව්‍යාපෘති තෝරා ගැනීමේදී 2009, 2010 හා 2011 වර්ෂවල දැයට කිරුළ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳව ලැබූ අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කර මෙවර ව්‍යාපෘති තෝරා ගතයුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි. පසුගිය වර්ෂවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හඳුනාගත් අඩුපාඩු මෙවර සිදු නොවනසේ සහ විවිධ අමාත්‍යාංශ හා ආයතන විසින් කරනු ලබන වියදම් ප්‍රදර්ශනය අවසන් වීමෙන් පසුව ද ප්‍රදේශයේ ජනතාවට ප්‍රයෝජනවත් වන තිරසාර සංවර්ධනයට හේතුවන පරිදි ක්‍රියාත්මක කිරීමට වගබලා ගත යුතුය.

06. භාණ්ඩාගාරය වෙත ලැබී ඇති වාර්තා අනුව මොණරාගල පැවති 2011 දැයට කිරුළ වැඩසටහන හා ප්‍රදර්ශනය සඳහා හා ඒ ආශ්‍රිතව ප්‍රදේශයේ මහාමාර්ග, වාරිමාර්ග, පාසල්, රෝහල්වල සංවර්ධන කටයුතුද ඇතුලත්ව දරා ඇති සමස්ත වියදම රු.මිලියන 5,023 ක් පමණ වේ. ඔබ අමාත්‍යාංශ විසින් 2009-2011 වසර දක්වා මෙම වැඩසටහන වෙනුවෙන් දරන ලද බවට අප වෙත වාර්තා වී ඇති පිරිවැය සඳහන් උපලේඛණයක් ඔබගේ දැන ගැනීම සඳහා මෙයට යාකර ඇත.

07. එමෙන්ම, 2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී යෝජිත දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ වැඩසටහන් සඳහා සංවර්ධන වියදම් යටතේ වෙනම වැය අයිතමයක් (Line Item) නිශ්චිතව සඳහන් කොට ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි. වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වන ඉදිකිරීම් ආදී කටයුතු සඳහා එම ප්‍රදේශයේ සිටින අදාල ක්ෂේත්‍රයන්හි නියුතු වූවන්ට ප්‍රමුඛත්වය දීමට කටයුතු කළයුතු අතර, මෙම ප්‍රදර්ශනය පැවැත්වීම තුලින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතුවල ප්‍රතිලාභ එම ප්‍රදේශයේ ජනතාවට ලැබෙන බව තහවුරු වන අයුරින් කටයුතු කළ යුතුය.

08. 2012 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට අදාලව දැරිය යුතු අනෙකුත් පොදු වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අනුරාධපුරයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති යටතේ වෙන් කිරීමට කටයුතු කර, දැයට කිරුළ ලේකම් කාර්යාලයේ උපදෙස් මත එම කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇති බව වැඩිදුරටත් සැලකුව මැනවි.

09. මෙම ජාතික සංවර්ධන වැඩසටහනට අදාලව ව්‍යාපෘති තෝරා ගැනීමේදී පළාතට ආවේනික වූ ගැටළු කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය. සමස්ථ පළාතම ආවරණය වන අයුරින් ජීවනෝපාය සංවර්ධනය, කෘෂිකාර්මික, වාරිමාර්ග, මහාමාර්ග, සෞඛ්‍ය, අධ්‍යාපන හා අනෙකුත් පොදු පහසුකම් යන ක්ෂේත්‍රයන් මෙහිදී විශේෂ වන අතර, එවැනි ක්ෂේත්‍ර ඉලක්ක කරගත් වැඩසටහන් කෙරෙහි යෝජිත ආයෝජනයද තිරසාර පදනමකින් සිදුවිය යුතුය.

10. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් 2011 අයවැයට සමගාමීව ප්‍රකාශිත මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි ශ්‍රී ලංකාව ආසියාවේ නැගී එන ආශ්චර්යය සඳහා සැකසූ ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුල විවිධාංගීකරණය වූ සමබර ප්‍රාදේශීය සංවර්ධනයක් හමුවේ ``රජරට උදානය`` සඳහා සුවිශේෂී වැඩපිළිවෙලක් හඳුනාගන්නා ලදී. එහිදී 2016 වසරේදී ළඟාකර ගැනීමට අපේක්ෂිත කාර්යය සාධනය, එම පළාතේ දේශීය නිෂ්පාදනය, ඒක පුද්ගල ආදායම වැඩිවීම, දරිද්‍රතා අනුපාතය අඩු කිරීම හා සෞඛ්‍ය තත්වය හා අධ්‍යාපන තත්ත්වයන් වැඩිදියුණු කිරීම යනාදී වූ ඉලක්ක ළඟාකර ගැනීමට ඉවහල් වන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහනක් සැළසුම් කළයුතු වේ. ඒ අනුව 2012 දැයට කිරුළ වැඩ සටහන, රජරට උදානය වැඩ පිළිවෙල තවදුරටත් ඉහළ නංවන කේන්ද්‍රිය වැඩ පිළිවෙලක් කරගැනීම අපේක්ෂාවයි. ඒ සඳහා අවශ්‍ය ආයෝජනය මධ්‍ය කාලීන වියදම් රාමුව තුල දැනටමත් හඳුනාගෙන ඇති මධ්‍යම රජයේ වාර්ෂික අයවැයෙන් හා පළාත් සභා සඳහා වූ ආයෝජන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතය. එසේම, මෙම සංවර්ධන ක්‍රියාදාමය තුලින් සංවර්ධනය වන සියළුම යටිතල පහසුකම් පවත්වාගෙනයාමේ හා අනාගතයේ පුනරුත්ථාපනය කිරීමේ වියදම් සපුරා ගැනීමට හැකිවන අයුරින් පළාතේ ආදායම් උත්පාදන ප්‍රභවයන් හඳුනා ගැනීමටද ප්‍රමුඛත්වය දිය යුතුවේ.

11. 2012 දැයට කිරුළ වැඩ සටහන සඳහා රුපියල් මිලියන 6,000 ක පමණ සෘජු ප්‍රතිපාදන විවිධ අමාත්‍යාංශ යටතේ යොමු කිරීමට සැළසුම් කර ඇති බැවින්, යෝජිත වැඩසටහන්, මැදි ආදායම් ලබන රටක් වශයෙන් ශ්‍රී ලංකාව අත්විඳින සංවර්ධන ප්‍රතිලාභ උතුරුමැද පලාත වැනි ප්‍රදේශයක් සංවර්ධන මාවතේ ඉහළට ඔසවා තැබීමට ඉවහල් වන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඇතුළු ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම අරමුණු කර ගත් සමස්ථ සංවර්ධන ක්‍රියාවලියේම කොටසක් බවට පත්කර ගැනීමට ඔබ සැමගෙන් ලැබෙන දායකත්වය අගය කරමි.

පී.බී. ජයසුන්දර
ලේකම්
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

පිටපත් :
1. විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ ගරු අමාත්‍යතුමා
2. ජනාධිපති ලේකම්
3. අග්‍රාමාත්‍ය ලේකම්
4. අමාත්‍ය මණ්ඩල ලේකම්
5. විගණකාධිපති
6. දිසාපති, අනුරාධපුරය